දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

PL-3

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/5/1/28/2/2011
ඔබේ අංකය / உமது இல. / Your No.: 12121-II වෙළුම
දිනය / திகதி / Date: 2014.01. 07

09 JAN 2014

Add. Sec (AD)
PNA please.
9/1/14

ලේකම්
තැපැල් සේවා අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

උක්ත කරුණ සම්බන්ධව ඔබේ සමාංක හා 2013.12.05 දිනැති ලිපිය හා බැඳේ.

02. යථෝක්ත ලිපියෙන් ඉදිරිපත් කරන ලද කරුණු අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.02.28 දින අනුමත කර එහි ලේකම් විසින් 2012.05.17 දින සහතික කර එවන ලද ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ රියදුරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ 3.3, 7.2.2.2 හා 7.3.2.2 යන ස්ථානයන්හි සඳහන්ව ඇති A පන්තියේ රියදුරු බලපත්‍රය යන්න D පන්තියේ රියදුරු බලපත්‍රය ලෙසට සංශෝධනය කිරීම අනුමත කර ඇති බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වමි.

ඩබ්.බී.පී. සිල්වා
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් :

1. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව
2. ආයතන අධ්‍යක්ෂ ජනරාල්
3. තැපැල්පති, තැපැල් දෙපාර්තමේන්තුව

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

PMG/PA/ 14 85 /2012

10/04/2510/12

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/5/1/28/2/201

ඔබේ අංකය / உமது இல. / Your No.: 12121 උපගොනුව

දිනය / திகதி / Date: 2012.05.21

22 MAY 2012

ලේකම්,

තැපැල් සේවා අමාත්‍යාංශය.

<u>තැපැල් සේවා දෙපාර්තමේන්තුවේ රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම් පරිපාටිය නිර්දේශ කිරීම.</u>

<u>රා.ප.ච.06/2006 අනුව බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීම.</u>

<u>තැපැල් දෙපාර්තමේන්තුව - ප්‍රාථමික - ශිල්පීය නිලධර ගණය.</u>

උක්ත කරුණ හා සම්බන්ධ ඔබේ සමාංක හා 2012.04.25 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මෙ සමග එවමි.

බී.එම්.බී.එම්. ඒ.බටුගෙදර
සහකාර ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් - 01. තැපැල්පති - තැපැල් සේවා දෙපාර්තමේන්තුව - (මුල් පිටපත මෙ සමඟ එවමි.)
02. ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - (මුල් පිටපත මෙ සමඟ එවමි.)
03. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - (මුල් පිටපත මෙ සමඟ එවමි.)

10/04/352/14
FMG/PA/MIN/ 58 /2014
10/07/0169/14

# තැපැල් සේවා අමාත්‍යාංශය
# தபால் சேவைகள் அமைச்சு
# MINISTRY OF POSTAL SERVICES

6 සහ 7 වැනි මහල, තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල, 310, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.
6 ஆம் 7ஆம் மாடி, அஞ்சல் தலைமையகம், 310, டி. ஆர். விஜேவர்தன மாவத்தை, கொழும்பு 10. 6th and 7th Floors, Postal Headquarters Building, 310, D.R. Wijewardhana Mawatha, Colombo 10.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. 12121 උපගොනුව | ඔබේ අංකය / உமது இல. / Your No. 11/01/77/2011 | දිනය / திகதி / Date 2014/01/10 |

තැපැල්පති,

**ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබටද පිටපතක් සහිතව මා වෙත යොමුකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක PSC/EST/5/1/28/2/2013 හා 2014/01/07 දිනැති ලිපිය හා බැඳේ. (පිටපතක් අමුණා ඇත)

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012/02/28 දින අනුමත කර එහි ලේකම් විසින් 2012/05/17 දින සහතික කර එවන ලද ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ රියදුරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ 3.3, 7.2.2.2 හා 7.3.2.2 යන ස්ථානයන්හි සඳහන්ව ඇති A පන්තියේ රියදුරු බලපත්‍රය යන්න D පන්තියේ රියදුරු බලපත්‍රය ලෙස සංශෝධනය කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව දන්වමි.

ජේ.එස්.එම්.එස්. මහානාම
අතිරේක ලේකම් (පාලන)
තැපැල් සේවා ලේකම් වෙනුවට

17 JAN 2014

**පිටපත :**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව. — කරු. ඔබගේ අංක PSC/EST/5/1/28/2/2013 හා 2014/01/07 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / General Office 2422591-3
ෆැක්ස් අංක / தொலைநகல் இல. / Fax Nos. 2440488, 2323465, 2541531
අමාත්‍ය / அமைச்சர் / Minister 2451900, 2392765
ලේකම් / செயலாளர் / Secretary 2445111, 2445333
Web : www.telepost.gov.lk E-mail: gen@telepost.gov.lk

# ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේහි

## ප්‍රාථමික - ශිල්පීය නිලධර ගණය සඳහා වන

## බඳවා ගැනීමේ පටිපාටිය

**1.** සම්බන්ධවන ආයතන :

1.1. දෙපාර්තමේන්තුව : තැපැල් යොමු අංකය:- 11/01/77/2011 දිනය:- 2011.06.03

1.2. අමාත්‍යාංශය : තැපැල් සේවා යොමු අංකය:- 12121 දිනය:- 2011.06.08

1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම යොමු අංකය:- DMS/C04/28-01 දිනය:- 2011.07.28

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය යොමු අංකය:- EST-2/RECRU/05/5020 දිනය:- 2011.07.26

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය යොමු අංකය:- NSCC/02/48/21/SR-1 දිනය:- 2011.11.16

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය යොමු අංකය:- PSC/ET/S/1/28/2/2011 දිනය:- 2012.02.28

**2.** පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1. පත් කිරීම් බලධරයා : තැපැල්පති

**3.** නිලධර ගණය පිළිබඳ විස්තර

3.1. නිලධර ගණය : ප්‍රාථමික ශිල්පීය

3.2. ශ්‍රේණි - මෙම නිලධර ගණය ශ්‍රේණි 04 කින් සමන්විත වේ.

(අ). III ශ්‍රේණිය
(ආ). II ශ්‍රේණිය
(ඇ). I ශ්‍රේණිය
(ඈ). විශේෂ ශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :
තැපැල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාදාමයන් පවත්වාගෙන යාම සඳහා වූ මූලික අවශ්‍යතාවන් වන ප්‍රවාහණය, වාහන නඩත්තුව හා අළුත්වැඩියාව පැවරෙන්නාවූ, මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් විසින් පිරිනැමෙන A පන්තියේ රියදුරු බලපත්‍රයක් මගින් තහවුරු කෙරෙන ශිල්පීය හා වෘත්තීය කුසලතා අවශ්‍ය වන්නාවූ සේවා ගණයකි.

4. තනතුරේ ස්වභාවය :

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි

5. වැටුප් :-

5.1. වැටුප් කේත අංකය :- PL 3 – 2006 (ඒ)

5.2. වැටුප් පරිමාණය :- 12,470 - 10 x 130 – 10 x 145 – 10 x 160 – 12 x 170 – 18,860

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| 111 | 01 | 12,470 |
| 11 | 12 | 13,915 |
| 1 | 22 | 15,380 |
| විශේෂ | 32 | 16,990 |

6. නිලධර ගණයට අයත් තනතුර / තනතුරු :

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| | අනුමත තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් | |
|---|---|---|---|---|
| 1 | රියදුරු | 186 | 1 | තැපැල් දෙපාර්තමේන්තුවට අයත් රථවාහන ධාවනය කිරීම. |
| | | | 2 | නිලධාරීන් ප්‍රවාහණය සහ තැපැල් භාණ්ඩ හා සැපයුම් උපකරණ හා වෙනත් දේ සුරක්ෂිතව ප්‍රවාහණය කර භාර දීම. |
| | | | 3 | රථවාහන නඩත්තුව හා මනා ලෙස පවත්වාගෙන යාම. |
| | | | 4 | මෝටර් රථවාහන ආඥා පනතේ විධිවිධාන පරිදි ක්‍රියා කිරීම. |
| | | | 5 | තැපැල් ප්‍රවාහන අංශයේ ධාවනය වන වාහන වල ඇති නඩත්තු කටයුතු ඉටු කිරීම සඳහා වාර්තා කිරීම. |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 186

* ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්වීමේ කාර්යයන් සඳහා III , II , I හා විශේෂ ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

සටහන : තැපැල් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ කලින් කලට මෙම සේවක සංඛ්‍යාව වෙනස් විය හැකිය.

## 7. බඳවා ගැනීමේ ක්‍රමය :

### 7.1. බඳවා ගන්නා අනුපාතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 30% |
| සීමිත | 70% |
| කුසලතා | නැත |

### 7.2. විවෘත බඳවා ගැනීම :

ලිඛිත පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වා එම පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙලට පුරප්පාඩු පිරවීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සහ වෘත්තීය පරීක්ෂණය යන පරීක්ෂණ දෙක සඳහාම ලබන කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලැබේ.

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම්:

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්වී තිබීම.

7.2.2.2. වෘත්තීය සුදුසුකම : මෝටර් රථ ප්‍රවාහණ කොමසාරිස් විසින් නිකුත් කළ A පන්තියේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

7.2.2.3. පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසුව රථ පැදවීම පිළිබඳ වසර 3 කට නොඅඩු පළපුරුද්ද. (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය)

7.2.2.4. කායික සුදුසුකම් : (i) උස අඩි 5 යි අඟල් 2½ කට (සෙ.මී. 157) නොඅඩු වීම

(ii) සෑම අයදුම්කරුවෙක්ම දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක අවශ්‍ය කවර හෝ වේලාවක, රියදුරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය. (රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මඟින් ඒ බව සනාථ කළ යුතුය.)

7.2.2.5. වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වන බවට ග්‍රාම නිලධාරී විසින් සනාථ කළ යුතුය.

III. පුරුෂ පාර්ශවය පමණක් අයදුම් කළ යුතුය.

IV. සුදුසුකම් ලබන දිනය - තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, ඉහත 7.2.2 සහ පහත 7.2.3. වන ඡේදයන්හි සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

7.2.3. වයස:

7.2.3.1. අවම සීමාව : අවු. 18

7.2.3.2. උපරිම සීමාව : අවු. 45
(රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.)

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1. ලිඛිත විභාගය :

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | මෝටර් රථ ආඥාපනත හා මහා මාර්ග නීති | 100 | 40 |

විෂයය නිර්දේශය උප ලේඛණය I හි දැක්වේ.

7.2.4.1.1. පවත්වන බලධරයා : තැපැල්පති

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය : ප්‍රායෝගික පරීක්ෂණයකි.

විස්තර උප ලේඛණ II හි දැක්වේ.

7.2.4.2.1. පවත්වන බලධරයා : තැපැල්පති

7.2.4.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.2.4.3.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : අදාල නොවේ

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම

7.2.4.4.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : තැපැල්පති

7.2.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම හෝ ආයතනයේ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම :

ලිඛිත පරීක්ෂණයක හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වා එම පරීක්ෂණය සමත් අයදුම්කරුවන් අතරින් කුසලතා අනුපිළිවෙලට පුරප්පාඩු පිරවීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සහ වෘත්තීය පරීක්ෂණය යන පරීක්ෂණ දෙක සඳහාම ලබන කුසලතා අනුපිළිවෙළ මත බඳවා ගනු ලැබේ.

7.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2. සුදුසුකම්:

7.3.2.1. අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ.

7.3.2.2. වෘත්තීය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කළ A පන්තියේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

7.3.2.3. පළපුරුද්ද :

(1). මෝටර් රථ පැදවීම පිළිබඳ වසර 3 ක පළපුරුද්ද. (සහතික මගින් සනාථ කළ යුතුය.)

(2). තනතුරේ ස්ථිර කරන ලද පූර්වාසන්න අවු. 5 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත තැපැල් සහායක සහ තැපැල් සහායක (කාර්මික) යන තනතුරුවල අයෙකු වීම.

සටහන : සීමිත තරග විභාග ප්‍රතිඵල අනුව පත්වීම සඳහා සුදුසුකම් ලබන අයගේ සංඛ්‍යාව, රියදුරු III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් නොවන විට ඉතිරි සංඛ්‍යාව විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත පුරවනු ලැබේ.

7.3.2.4. කායික සුදුසුකම් :

(i) උස අඩි 5 යි අඟල් 2½ කට (සෙ.මී. 157) නොඅඩු වීම.

(ii) සෑම අයදුම්කරුවෙක්ම දිවා කාලයේ සහ රාත්‍රී කාලයේදී ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක දවසේ කවර හෝ වේලාවක රියදුරු තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සහ මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය. (රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.)

7.3.2.5. වෙනත් :

(i) පුරුෂ පාර්ශවය පමණක් අයදුම් කළ යුතුය.

(ii) සුදුසුකම් ලබන දිනය - තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම් කරුවන් ඉහත 7.3.2. ඡේදයේ සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

7.3.2.6. වයස :

7.3.2.6.1. අවම සීමාව : අදාල නොවේ.

7.3.2.6.2. උපරිම සීමාව : සීමිත පදනම මත බඳවා ගැනීමේදී රජයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ

7.3.3. බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.3.1. ලිඛිත විභාගය

| | විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | මෝටර් රථ ආඥාපනත හා මහා මාර්ග නීති | 100 | 40 |

විෂයය නිර්දේශය උප ලේඛණය 1 හි දැක්වේ.

7.3.3.1.1. පවත්වන බලධරයා : තැපැල්පති

7.3.3.2. වෘත්තීය පරීක්ෂණය : ප්‍රායෝගික පරීක්ෂණයකි. විස්තර උප ලේඛණ 11 හි දැක්වේ.

7.3.3.2.1. පවත්වන බලධරයා : තැපැල්පති

7.3.3.3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ.

7.3.3.3.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පත් කරන බලධරයා : අදාල නොවේ.

7.3.3.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ශ්‍රී ලංකා තැපැල් කාර්යාල චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

7.3.3.4.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : තැපැල්පති

7.3.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : ශ්‍රී ලංකා තැපැල් කාර්යාල චක්‍රලේඛයේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4. කුසලතා මත බඳවා ගැනීම :- අදාල නොවේ.

## 8. කාර්යක්ෂමතා කඩඉම :

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉම් ස්වභාවය ලිඛිත/වෘත්තීය/සහතික/පාඨමාලා/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත්වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |

විෂයය නිර්දේශ උප ලේඛණ III , IV හා V හි දැක්වේ.

8.2. පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්.

8.3. කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ :

8.3.1. පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද : තැපැල්පති විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද බලධරයන් විසින්, තැපැල්පති විසින් නියම කරනු ලබන මාර්ගෝපදේශ පරිදි පැවැත්විය යුතුය.

## 9. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව :

9.1.

| | ශ්‍රේණිය | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|---|
| 01 | රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය. |
| 02 | අනෙක් රාජ්‍ය භාෂාව | 2007.04.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හි III මට්ටම |

## 10. ශ්‍රේණි උසස් කිරීම :

### 10.1. III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම :

#### 10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1. සපුරා ලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ගණයේ III වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනයට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීම් දිනය පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය ලබා ගෙන තිබීම.
vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

#### 10.1.2. සුවිශේෂී කාර්ය සාධනය අනුව

10.1.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම
II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ III ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම නියමිත දිනට උපයාගෙන තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුල ලබාගෙන තිබීම.
VI. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.2.2. උසස් කිරීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන්ට පත් කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝගතා පරීක්ෂණයකට පෙනී සිටිය හැක. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති නිලධරයන්, පත් කිරීම් දින සිට වසර හයක් (06) ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

විභාග පරිපාටිය සහ විෂය නිර්දේශය සහ උප ලේඛණය VI වශයෙන් දැක්වේ.

සංහන :

- සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබා ගත යුතුය. තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර මෙම පරීක්ෂණය සඳහා නිලධරයෙකුට පෙනී සිටිය හැක්කේ <u>**එක් වතාවක්**</u> පමණි.

- නිලධරයෙකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයෙකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දිනය වේ.

10.2. IIවන ශ්‍රේණියට සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ශ්‍රේණියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.
II. පූර්වාසන්නයෙන් වූ වසර පහ (05) තුල සතුටුදායක් සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුල සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම් සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2.2. සුවිශේෂී කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

10.2.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ගණයේ 11 ශ්‍රේණියේ අවම වශයෙන් වසර අට (08) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අට (08) ම නියමිත දිනට උපයාගෙන තිබීම.
ii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව පූර්වාසන්න වසර අට (08) තුළම සුවිශේෂී කාර්ය සාධන මට්ටමක් පෙන්නුම් කර තිබීම.
iii. පූර්වාසන්නයෙන් වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.2.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් සඳහා පත් කිරීම් බලධරයා විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා නිලධාරයන් 11 ශ්‍රේණියට උසස් වී වසර අට (08) ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර උප ලේඛනය VII හි දැක්වේ.

10.3. නිලධර ගණයෙහි 1 වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1. සාමාන්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරන්නන්

10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.
ii. පූර්වාසන්නයෙන් වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය : (සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වන පරීක්ෂණ වලට පෙනී සිටීම) සුවිශේෂී කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්යසාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වන ලිඛිත අභියෝගතා පරීක්ෂණය / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

**11.** තනතුරු වලට පත් කිරීම :

පවත්නා ඇබෑර්තු අනුව පත් කෙරේ

11.1. සුදුසුකම් :

| තනතුර | සුදුසුකම් |
|---|---|
| රියදුරු | සේවා ගණයේ III, II, I හෝ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම |
| වෑන් ඕවර්සියර් | සේවා ගණයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම |

11.2. තෝරා ගනු ලබන ක්‍රමය :

11.2.1. විවෘත සහ සීමිත තරග විභාග වලින් සමත් වන්නන් ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර එහිදී දක්වන කුසලතාවය අනුව පවත්නා ඇබෑර්තු වලට පත් කරනු ලැබේ.

11.2.2. වෑන් ඕවර්සියර් තනතුර සඳහා විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨතාවය අනුව පත් කෙරේ.

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :

අදාල නොවේ.

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :

අදාල නොවේ.

**14.** සේවයේ යෙදී සිටින කැපැල් රියදුරන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම :

උප ලේඛණය VIII හි දැක්වේ.

**15.** මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේ නම්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.

සකස්කළේ : අත්සන :- ...........................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : පී.ඩබ්.පී. විජේසිංහ
තනතුර : ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)
දිනය : 2011.06.03

පරික්ෂා කළේ : අත්සන :- ...........................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : අශෝක මාම්පිටියආරච්චි
තනතුර : නියෝජ්‍ය තැපැල්පති (පාලන)
දිනය : 2011.06.03

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ...........................................

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න
තනතුර : තැපැල්පති

දිනය : ~~2011.06.03~~ 2012.04.17

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති

යොමු අංකය : 12121

ප්‍රාථමික ශිල්පීය නිලධර ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ...........................................

නම : හේමසිරි ප්‍රනාන්දු
ලේකම්,
තැපැල් සේවා අමාත්‍යාංශය

දිනය : ~~2011.06.08~~ 2012.04.25

නිල මුද්‍රාව : හේමසිරි ප්‍රනාන්දු
ලේකම්
තැපැල් සේවා අමාත්‍යාංශය
තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල,
අංක. 310, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10

යොමු අංකය : ...........................................

ප්‍රාථමික ශිල්පීය නිලධර ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2012 - 02 - 28 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ...........................................

නම : ...........................................

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2012 - 05 - 17

නිල මුද්‍රාව : ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය, 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

උප ලේඛණය I

01. විභාගයේ නම : ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ තැපැල් රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය / සීමිත තරග විභාගය

02. විභාගය පිළිබඳ විස්තර : විභාගය සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පැවැත්වේ.

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1. | මෝටර් රථ ආඥා පනත සහ මාර්ග නීති | පැය 02 | 100 | 40 % |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : තැපැල්පති

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය පරිදි වසරකට වරක්.

05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | | විෂයය නිර්දේශය |
|---|---|---|---|
| (i). | මෝටර් රථ ආඥා පනත සහ මාර්ග නීති | 1 | මෝටර් රථවාහන පනත යටතේ රියදුරන් සතු වගකීම් ආදායම් බලපත්‍ර, රථවාහන ලියා පදිංචිය, රක්ෂණය සහ පැවරීම් |
| | | 2 | මහාමාර්ග නීති, මාර්ග සංඥා |
| | | 3 | රථවාහන පොලිසිය සතු වගකීම් |

සකස්කලේ :

අත්සන :- ...................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2011.06.03

පරීක්ෂා කලේ :

අත්සන :- ...................

නම :- අශෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2011.06.03

අත්සන : ................... (දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : ~~2011.06.03~~ 2012.04.17

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න තැපැල්පති

**උප ලේඛණය II**

1. විභාගයේ නම : ප්‍රාථමික ශිල්පිය නිලධර ගණයේ තැපැල් රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය.

2. ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන්නන් තැපැල්පති විසින් තීරණය කරන පරිදි පහත සඳහන් නිලධාරීන්ගෙන් යුතු පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්විය යුතුය.

   1. තැපැල් දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරියෙක් (සභාපති)
   2. මෝටර් රථ ප්‍රවාහණ දෙපාර්තමේන්තු පරීක්ෂකවරයෙක්
   3. පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙක්

මෙම ප්‍රායෝගික පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායකයන් උපයෝගී කරගත යුතුවේ.

| | නිර්ණායකය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|---|
| i. | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ | 50 | 40% |
| ii. | මෝටර් රථ ආඥා පනත සහ මාර්ග නීති | 50 | 40% |

I. සියළු විෂයයන් එකවර සමත් විය යුතු අතර එක් විෂයකට අවම වශයෙන් ලකුණු 40 % ක් (එක් එක් විෂයයට ලකුණු 20 බැගින්) ලබා ගතයුතුය.

සකස්කළේ :

අත්සන :- ........................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2011.06.03

පරීක්ෂා කළේ :

අත්සන :- ........................

නම :- අශෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2011.06.03

අත්සන : ........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : ~~2011.06.03~~ 2012.04.17

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න තැපැල්පති........................

## උප ලේඛණය III

1. විභාගයේ නම : ප්‍රාථමික ශිල්පීය නිලධර ශ්‍රේණියේ තැපැල් රියදුරු තනතුරු සඳහා පැවැත්වෙන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර :

තනතුරට ප්‍රමාණවත් වන ආකාරයෙන් පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව නිලධාරියාට ප්‍රමාණවත් දැනුමක් පවතින්නේද යන්න මැන බැලීමේ ලිඛිත පරීක්ෂණයකි

| විෂයය | විෂයය ක්ෂේත්‍රය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, ලිපි ගණුදෙනු කිරීමේ මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය | 50 | 40% |
| රජයේ වාහන පරිහරණය හා නඩත්තුව | • මෝටර් රථ රියදුරන්ගේ රාජකාරි හා වගකීම<br>• රජයේ වාහන නඩත්තු කිරීම හා ආරක්ෂාව සම්බන්ධ රියදුරුගේ වගකීම<br>• දෛනික ධාවන සටහන් පොත<br>• වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම<br>• වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු<br>• රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග | 50 | 40% |

I. සියළු විෂයයන් එක වර සමත් විය යුතු අතර එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40 % ක් (එක් එක් විෂයයට ලකුණු 20 බැගින්) ලබා ගතයුතුය.

II. තනතුරට බඳවා ගැනීම සඳහා වූ ලිඛිත විභාගයට පෙනීසිටි භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය.

3. විභාගය පවත්වනු ලබන බලධරයා : තැපැල්පති

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

| සකස්කළේ : | | පරීක්ෂා කළේ : | |
|---|---|---|---|
| අත්සන :- | .................................... | අත්සන :- | .................................... |
| නම :- | පී.ඩබ්.පී. විජේසිංහ | නම :- | අසෝක මාම්පිටියආරච්චි |
| තනතුර :- | ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන) | තනතුර :- | නියෝජ්‍ය තැපැල්පති (පාලන) |
| දිනය :- | 2011.06.03 | දිනය :- | 2011.06.03 |

අත්සන : ....................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : ~~2011.06.03~~ 2012-04.17

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති

**උප ලේඛණය IV**

1. විභාගයේ නම : ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ තැපැල් රියදුරු තනතුරු සඳහා පැවැත්වෙන 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර :

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී මැන බලන ලද පරාසය ඇතුලත ගතවූ සේවා කාලය තුල අදාල ක්ෂේත්‍රයේ සිදු වී ඇති පටිපාටිමය, නීතිමය වෙනස්වීම හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි මැන බැලීම සඳහා වන ලිඛිත පරීක්ෂණයකි.

3. ලිඛිත පරීක්ෂණය පහත සඳහන් නිර්ණායකයන් උපයෝගී කර ගත යුතුය

| | ප්‍රශ්න පත්‍රය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| i. | මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 50 | 40 % |
| ii. | මෝටර් රථ යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 40 % |

III. සියළු විෂයයන් එක වර සමත් විය යුතු අතර එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40 % ක් (එක් එක් විෂයයට ලකුණු 20 බැගින්) ලබා ගතයුතුය.

4. තනතුරට බඳවා ගැනීම සඳහා වූ ලිඛිත විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයයෙන්ම පිළිතුරු සැපයිය යුතුය.

5. විභාගය පවත්වනු ලබන බලධරයා : තැපැල්පති

6. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

සකස්කලේ :

අත්සන :- ..............................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2011.06.03

පරීක්ෂා කලේ :

අත්සන :- ..............................

නම :- අශෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2011.06.03

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : ~~2011.06.03~~

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති..............................

උප ලේඛණය V

1. විභාගයේ නම : ප්‍රාථමික ගිල්පිය නිලධර ගණයේ තැපැල් රියදුරු තනතුරු සඳහා පැවැත්වෙන 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2. විභාගය පිළිබඳ විස්තර :

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| I. | මෝටර් රථ යාන්ත්‍රික දැනුම | පැය 01½ | 100 | 40% |
| II. | මෝටර් රථ වාහන පනත සහ මහා මාර්ග නීති | පැය 01½ | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : තැපැල්පති

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

5. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|---|
| (i). | මෝටර් රථ යාන්ත්‍රික දැනුම | ධාවනයේදී හා භාවිතයේදී ඇතිවන සරල යාන්ත්‍රික දෝෂ හඳුනා ගැනීම හා ඒ පිළිබඳ ගත යුතු පියවර පිළිබඳ අවබෝධය. |
| (ii). | මෝටර් රථවාහන පනත සහ මාර්ග නීති | මෝටර් රථවාහන පනතේ විධි විධාන, මහා මාර්ග උපදෙස් සංග්‍රහය, මාර්ග නීති පිළිබඳ අවබෝධය. |

සකස්කළේ :

අත්සන :- ..............................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2011.06.03

පරීක්ෂා කළේ :

අත්සන :- ..............................

නම :- අශෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2011.06.03

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : ~~2011.06.03~~ 2011/06/17.

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති

උප ලේඛණය VI

1. විභාගයේ නම : ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ තැපැල් රියදුරු තනතුරෙහි III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ විභාගය.

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 02 | 100 | 60 % |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක්වරක්

5. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | තමා වෙත පැවරෙන සියළු කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප මෙන්ම අපේක්ෂිත ප්‍රවීණතාවන් අත්පත් කරගෙන තිබේද යන්න මැන බැලීමේ ලිඛිත පරීක්ෂණයකි. |

6. තනතුරට බඳවා ගැනීම සඳහා වූ ලිඛිත විභාගයේදී පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු වේ.

සකස්කළේ :

අත්සන :- ..............................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2011.06.03

පරීක්ෂා කළේ :

අත්සන :- ..............................

නම :- අශෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2011.06.03

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : බී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : ~~2011.06.03~~ 2012-04-17

නිල මුද්‍රාව : බී. එල්. පී. ආර්. අභයරත්න තැපැල්පති

උප ලේඛණය VII

**ප්‍රාථමික ශිල්පීය නිලධර ගණයේ තැපැල් රියදුරු තනතුරු කනතුරෙහි II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.**

1. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර :

| | | |
|---|---|---|
| 1) විශේෂ කුසලතා | - | ලකුණු 50 |
| 2) කාර්ය සාධන අගැයුම | - | ලකුණු 45 |
| 3) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අගැයුම | - | ලකුණු 05 |

1.1. විශේෂ කුසලතා:

පැවරෙන සාමාන්‍ය රාජකාරි වලට අමතරව දක්වන සුවිශේෂී කුසලතා, රාජකාරියට දක්වන සුවිශේෂී කැපවීම හා රාජකාරි සමගාමී ක්‍රියාකාරකම් යනාදිය සඳහා දක්වන සුවිශේෂී දායකත්වය වෙනුවෙන් එක් දායකත්වයක් සඳහා ලකුණු 05 බැගින් උපරිම ලකුණු 50 කට යටත්ව ලකුණු දෙනු ලැබේ.

1.2. කාර්ය සාධන ඇගැයුම :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන වර්ෂයට පූර්වාසන්න වසර 05 ක් තුල විශිෂ්ඨ කාර්ය සාධන මට්ටමට එක් වසරක් වෙනුවෙන් ලකුණු 09 බැගින් ද සාමාන්‍ය තත්ත්වයට ඉහළ කාර්ය සාධන මට්ටමට එක් වසරක් වෙනුවෙන් ලකුණු 06 බැගින් ද, සාමාන්‍ය කාර්ය සාධන මට්ටමට එක් වසරක් වෙනුවෙන් ලකුණු 03 බැගින් ද උපරිම ලකුණු 45 කට යටත්ව ලකුණු දෙනු ලැබේ.

1.3. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිර්දේශ :

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අදහස අනුව අපේක්ෂකයාගේ යෝග්‍යතාවයට උපරිම ලකුණු 05 කට යටත්ව ලකුණු දෙනු ලැබේ.

සකස්කළේ :

අත්සන :- ..............................

නම :- පී.ඩබ්.පී. විජේසිංහ

තනතුර :- ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන)

දිනය :- 2011.06.03

පරීක්ෂා කළේ :

අත්සන :- ..............................

නම :- අසෝක මාම්පිටියආරච්චි

තනතුර :- නියෝජ්‍ය තැපැල්පති (පාලන)

දිනය :- 2011.06.03

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඩී.එල්.පී.ආර්. අභයරත්න

තනතුර : තැපැල්පති

දිනය : ~~2011.06.03~~ 2012.04.17

නිල මුද්‍රාව : ඩී. එල්. පී. ආර්. අභයරත්න
තැපැල්පති..............................

## සේවයේ යෙදී සිටින තැපැල් රියදුරන් නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම

(නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාල වේ.) නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) මගින් ලබා දී ඇති PL 03 - 2006 ඒ වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන තැපැල් රියදුරු සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරණු ලැබේ. (සේවා කාලය ගණන් ගනු ලබනුයේ තැපැල් රියදුරු තනතුරට පත් කරන ලද දිනය පදනම් කරගෙනය.) කෙසේ වුවත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල නැතැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්ථනයේදී අදාල නැතැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර, නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊලඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.

(i). PL 03 - 111 ශ්‍රේණිය

(අ) PL 03 – 2006 ඒ වැටුප් පරිමාණයෙහි 111 ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තැපැල් රියදුරු තනතුරෙහි යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර නැති තැපැල් රියදුරන්.

PL 03 - 111 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.

(ii). PL 03 - 1 ශ්‍රේණිය

(අ) PL 03 – 2006 ඒ වැටුප් පරිමාණයෙහි 1 ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තැපැල් රියදුරු තනතුරෙහි යටත් පිරිසෙයින් වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති සහ / හෝ වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන නොමැති තැපැල් රියදුරන්.

(ආ) ඉහත සඳහන් පරිදි 1 ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක වසර 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබුනද විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති තැපැල් රියදුරන්.

PL 03 - 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.

(iii). PL 03 - විශේෂ ශ්‍රේණිය

(අ) 1 ශ්‍රේණියෙහි යටත් පිරිසෙයින් අවුරුදු 09 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක නවය (09) ක් උපයා ගෙන ඇති හා අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති තැපැල් රියදුරන්.

PL 03 - විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.

| සකස්කළේ : | | පරීක්ෂා කළේ : | |
|---|---|---|---|
| අත්සන :- | .................................... | අත්සන :- | .................................... |
| නම :- | පී.ඩබ්.පී. විජේසිංහ | නම :- | අශෝක මාම්පිටියආරච්චි |
| තනතුර :- | ජ්‍යෙෂ්ඨ පාලන ලේකම් (මූලස්ථාන) | තනතුර :- | නියෝජ්‍ය තැපැල්පති (පාලන) |
| දිනය :- | 2011.06.03 | දිනය :- | 2011.06.03 |

| | | |
|---|---|---|
| අත්සන | : | .................................... (දෙපාර්තමේන්තු ප්‍රධානියා) |
| නම | : | බී.එල්.පී.ආර්. අභයරත්න |
| තනතුර | : | තැපැල්පති |
| දිනය | : | ~~2011.06.03~~ 2012.04.17 |
| නිල මුද්‍රාව | : | බී. එල්. පී. ආර්. අභයරත්න තැපැල්පති |